


POLICY BRIEF

# රෝගීන්ගේ අයිතිවාසිකම්

## මානසික සෞඛ්‍යයට ප්‍රමුඛත්වය ලබා දීම

COVID-19 වසංගතය සහ ආර්ථික අර්බුදය ජනතාවගේ සෞඛ්‍ය අයිතියට ඇති කරන ලද බලපෑම සම්බන්ධයෙන් ගවේෂණය කිරීම සඳහා නීතිය සහ සමාජ භාරය විසින් අධ්‍යයනයක් සිදු කෙරිණ. සෞඛ්‍යය, අධ්‍යාපනය, ජීවනෝපායන්, සාමකාමී සහජීවනය සහ යහපාලනය සඳහා ඇති අයිතිය ඇතුළත් මානව ආරක්ෂාව සුරක්ෂිත කිරීමට අර්ථවත් ආකාරයකින් සාමූහිකව දායක විය හැකි වන පරිදි, පුරවැසියන් සහ රාජ්‍යය අතර මෙන්ම පුරවැසියන් අතරද වන සමාජ සම්මුතීන් සම්බන්දයෙන් නැවත සලකා බැලීමේ අවශ්‍යතාවය පිළිබඳව ඔවුන් අපව දැනුවත් කළහ. සෞඛ්‍ය අයිතිය ඇතුළුව අපගේ මූලික මානව හිමිකම් සැමට එක ලෙසින් භුක්ති විඳීමේ හැකියාව සහතික කිරීම සඳහා අපගේ මානව සහ මූල්‍ය සම්පත් ක්‍රමාංකනය කළ හැකි ආකාරය පිළිබඳව විවෘත සංවාදයක් මෙන්ම නව අදහස් සහ උපාය මාර්ග අවශ්‍ය වේ. මෙම අධ්‍යයනයෙන් රෝගීන්ගේ අයිතිවාසිකම්, මහජන සෞඛ්‍ය, හදිසි අවස්ථා කළමනාකරණය සහ මානසික සෞඛ්‍ය ගැටළු හඳුනා ගැනීම මෙන්ම ඒවාට ප්‍රතිකාර කිරීම් වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රඥප්තියක් සම්බන්දයෙන් වන වැදගත් කරුණු අනාවරණය කෙරේ.

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

info@lstlanka.org

# රෝගීන්ගේ අයිතිවාසිකම්

## මානසික සෞඛ්‍යයට ප්‍රමුඛත්වය ලබා දීම

### හැඳින්වීම

2020 වර්ෂයේ දී ශ්‍රී ලංකාව කොවිඩ් වසංගතයට සූදානම්ව නොසිටියේ ය. රජය ප්‍රධාන වශයෙන් ම වෛරසය පැතිරීම පාලනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රතික්‍රිය ලෙස එම වසංගතයට ප්‍රතිචාර දැක්වූයේ ය. මෙය වෛරසය මගින් ඇති කළ ක්ෂණික මහජන සෞඛ්‍ය බලපෑම් අවම කිරීම සඳහා සාර්ථක ප්‍රවේශයක් විය.අවාසනාවකට මෙන් මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වය මෙන්ම රජයේ ප්‍රතිචාරය යන දෙකෙන් ම ඇති විය හැකි මනෝවිද්‍යාත්මක හානිය සහ මානසික සෞඛ්‍ය අභියෝග සැලකිල්ලට ගැනීමට රජය අපොහොසත් විය. මෙම අතපසුවීම දෛනික වැටුප් ලබන කම්කරුවන්, ඇඟළුම් කම්හල් සේවකයන්, බඩ්ර්ඔෂූ ප්‍රජාවේ සාමාජිකයන් වැනි සීමිත සමාජ හා ආර්ථික ආරක්ෂාවන් සහිත පුද්ගලයන්ට අසමානාත්මක ලෙස බලපෑ අතර, ඔවුන්ට වැඩි මානසික සෞඛ්‍ය අභියෝග අත්විඳීමට සිදුවීමේ ඉහළ අවදානමක් ඇති කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම කණ්ඩායම් දැඩි අවිනිශ්චිතතාවයන් සහිත තත්ත්වයන්ට තල්ලු වූ අතර, ඔවුන්ට වසංගතයේ අමතර නිහඬ, නොපෙනෙන, දිගු කාලීන මානසික සෞඛ්‍ය පිරිවැය දරා ගැනීමට සිදුවීමේ වැඩි ඉඩක් පැවතුණි.

මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය වර්ෂ 2022 සහ 2024 අතර කාලය තුළ දිවයිනේ දිස්ත්‍රික්ක 17 ක් පුරා පවත්වන ලද ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 18 ක් සහ මහජන අදහස් විමසීම් 13 ක් තුළින්  සොයාගන්නා ලද කරුණු පදනම් කරගෙන සකස් කර ඇත.මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය මගින් කොවිඩ් වසංගතය සඳහා දැක්වූ ප්‍රතිචාරය ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් මත ඇති කළ දිගුකාලීන, සෘණාත්මක, මානසික සෞඛ්‍ය ගැටළුවලට තුඩු දිය හැකි, අසමානාත්මක බලපෑම් ඉස්මතු කර පෙන්වන අතර, අනාගත මහජන සෞඛ්‍ය අර්බුද වලදී වඩාත් අන්තර්කරණය  වූ සහ සාධාරණ ප්‍රතිපත්ති සම්පාදනයක් සඳහා නිර්දේශ ද ඉදිරිපත් කරයි.

සෞඛ්‍යය සේවා වෙත ප්‍රවේශය, රෝගීන්ගේ අයිතිවාසිකම්, ජීවනෝපායන් සහ මානසික සෞඛ්‍යය සඳහා වඩා හොඳ ආරක්ෂණයන් සඳහා ඇති ඉල්ලුම සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහාය වීම, විශේෂයෙන් ම ආතතිකාරී කාල පරිච්ඡේද වලදී ඔවුන්ට සහාය වීම, පුළුල් සමාජ ආරක්ෂණයන් සඳහා ඇති නැවත අලුත් වූ ඉල්ලුම කෙරෙහි කොවිඩ් වසංගතය විසින් ඇති කළ සම්පූර්ණ සහ බහු-මාන බලපෑම අවබෝධ කර ගැනීම පිණිස කොවිඩ් වසංගතය ප්‍රජාවන් මත ඇති කළ බලපෑම පිළිබඳව සිදු කරන ලද අධ්‍යයන පදනම් කර ගෙන සකස් කළ මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය සොයාගත් අනෙකුත් කරුණු සමග කියවිය යුතු වේ.

### ඉහළ ගිය මානසික පීඩාවන් - ශ්‍රී ලංකාවේ වසංගත ප්‍රතිචාරය අතරතුර අවදානමට ලක්විය හැකි කණ්ඩායම්

ජනගහනයේ විශේෂිත අවදානමට ලක්විය හැකි කොටස්වලට කොවිඩ් වසංගතය අතරතුර දී දැඩි හානි සහ පීඩාවන් අත්විඳීමට සිදු වූ බව සොයාගන්නා ලද කරුණු වලින් පැහැදිලිව ම පෙන්නුම් කළ අතර, රජයේ ප්‍රතිචාරය වක්‍රාකාරයෙන් තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තමන්ට උපතේදී ම ලබා දී ඇති ස්ත්‍රී-පුරුෂ භාවයට ගැළපෙන නාගරික ඉහළ සහ මධ්‍යම පාන්තික වැටුප් ලබන සුදු කරපටි සේවකයින්ගේ අවශ්‍යතාවලට අනුව සකස් කර ඇත්තේ කෙසේද යන්න එයින් හෙළිවෙයි. එම කණ්ඩායම් හා සැසඳීමේ දී ග්‍රාමීය, දිළිඳු හෝ අවිධිමත් අංශයේ සේවය කරන ප්‍රජාවන් දීර්ඝ කාලීන මානසික සෞඛ්‍ය අභියෝගවලට ගොදුරු වීමේ සැලකිය යුතු ලෙස ඉහළ අවදානමකට මුහුණ දුන්හ.

මෙහිදී සොයාගන්නා ලද කරුණු තේමාත්මක ක්ෂේත්‍ර පහක් ඔස්සේ ඉදිරිපත් කරන අතර, ඒ සෑම ක්ෂේත්‍රයක් මගින් ම ශ්‍රී ලංකාවේ වසංගත ප්‍රතිචාරය විවිධ ප්‍රජාවන් කෙරෙහි ඇතිකළ අසම සහ අසමානුපාතික මානසික සෞඛ්‍ය බලපෑම් නිරූපණය කරයි.මෙම තේමා සැලකිය යුත්තේ වෙන් වෙන්ව පවතින හෝ හුදකලා ඒවා ලෙස නොව, ගැඹුරු ලෙස අන්තර් සම්බන්ධිත වූ මූලික මහජන සෞඛ්‍ය අර්බුදයෙන් ඔබ්බට විහිදී යන මානසික සෞඛ්‍ය ප්‍රතිඵල හැඩගැස්වීම සඳහා වෙන් වෙන්ව මෙන්ම එකවර ද ක්‍රියාත්මක වන ඒවා ලෙස ය.

# රෝගීන්ගේ අයිතිවාසිකම්
## මානසික සෞඛ්‍යයට ප්‍රමුඛත්වය ලබා දීම

### බිය, සාංකාව සහ මනෝසමාජයීය පීඩාව

වසංගතය අතරතුර දී සමාජ පරාසය පුරා සිටින ප්‍රජාවන් සාංකාවට සහ මානසික පීඩාවන්ට මුහුණ දුන්හ. කෙසේ වෙතත් පවුලේ වයෝවෘද්ධ සාමාජිකයන් සිටින හෝ පෙර සිට පැවති රෝගී තත්වයන් සහිත සමාජිකයන් සිටින පවුල විසින් වෛරසයට ඇති බිය දැඩි ලෙස ප්‍රකාශ කරන ලද අතර, අලුතින් ආසාදනයවීම් හා මරණ පිළිබඳව නිරන්තරව පළවූ මාධ්‍ය වාර්තා මගින් එය තවත් දැඩි විය.

මෙම කාලය තුළ දී රජය විසින් ගන්නා ලද තීරණ ද ශෝකය සහ කම්පනය තවත් දැඩි කිරීමට හේතු විය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ මගින් කොවිඩ් ආසාදනය වූවන්ගේ මෘතදේහ භූමදානය කිරීමට වුවද අවසර දී තිබියදීත්, කොවිඩ් වින්දිතයින්ගේ මෘතදේහ සියල්ල ම ආදාහනය කරන ලෙස රජය නියෝග කළේ ය. මුස්ලිම් ප්‍රජාවගේ චාරිත්‍රානුකූලව සහ ආගමිකව නියම කර ඇති අවමංගල්‍ය සම්මතයන්ට අනුව මෘතදේහ ආදාහනය කිරීම ශාපයක් වන බැවින් මෙම තීරණය විශේෂයෙන් ම මුස්ලිම් ප්‍රජාවන් තුළ සැලකිය යුතු ශෝකයක් සහ කම්පනයක් ඇති කළේ ය. මියගිය තම ආදරණීයයන් සඳහා සංස්කෘතික හා ආගමික වශයෙන් අර්ථාන්විත ආකාරයකින් අවසන් කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා නොදුන් බව අනෙකුත් ප්‍රජාවන් ද (බෞද්ධ හින්දු සහ ක්‍රිස්තියානි) පැමිණිලි කළහ. එය ඔවුන්ගේ ශෝකයට අමතරව වරදකාරිත්වය පිළිබඳ හැඟීමක් ද ඔවුන් තුළ ඇති කළේ ය. රට වසාදැමීම ඇතැම් ප්‍රජාවන්ට කනස්සල්ලට හේතුවක් විය. උදාහරණයක් ලෙස, නිදහස් වෙළඳ කලාපවල සේවකයන්ට අධික ලෙස ජනාකීර්ණ වූ නවාතැන්පළ තුළ රැඳී සිටීමට සිදු වූ අතර, වසංගතයේ උච්චතම අවස්ථාවේදී පවා ඔවුන්ට ඔවුන්ගේ පවුල් වලින් වෙන්වී සිටීමට සිදු විය. මෙම අත්දැකීම් මගින්, රෝග පැතිරීම පාලනය කරන ප්‍රතිචාර වලට වඩා චිත්තවේගය, හා මානසික යහපැවැත්ම ආරක්ෂා කරන අනාගත මහජන සෞඛ්‍ය ප්‍රතිචාරවල අවශ්‍යතාවය ඉස්මතු කර පෙන්වයි.

### නිර්දේශ

- මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහාය සේවා ලබා ගැනීමට තිබීම, ඒ සඳහා ප්‍රවේශය සහ ඒවාට ඇති පිළිගැනීම පුළුල් කිරීම, විශේෂයෙන් ම අධි අවදානම් සහිත ප්‍රදේශවල සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අතර ඒවා පුළුල් කිරීම.

- ජාතික මහජන සෞඛ්‍ය ප්‍රතිචාර සැලසුම් සකස් කිරීමේ වගකීම පැවරී ඇති ආයතනවලට මානසික යහපැවැත්ම පිළිබඳ විශේෂඥයින්, මනෝවිද්‍යාඥයින් සහ මනෝචිකිත්සකයින් ඇතුළත් කිරීම.

- සියලුම ජාතික මහජන සෞඛ්‍ය හදිසි ප්‍රතිචාර සැලසුම් වල ප්‍රධාන අංග වලට මානසික, චිත්තවේගීය සහ මනෝ සමාජීය වශයෙන් සලකා බැලිය යුතු අංග ඇතුළත් කළ යුතු බවට නියම කිරීම.

- සියලුම ජාතික මහජන සෞඛ්‍ය හදිසි ප්‍රතිචාර සැලසුම් මගින් ප්‍රජාවන්ට ඇති චිත්තවේගීය සහ මනෝ සමාජීය බලපෑම්, විශේෂයෙන් ම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් මත ඇතිකරන එම බලපෑම් පිළිබඳ ඇගයීම් සිදු කළ යුතු බවට නියම කිරීම.

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා අතරතුර දී සමබර, විනිවිදභාවයෙන් යුතු සහ සංවේදී නොවන වාර්තාකරණයන් ප්‍රවර්ධනය කිරීම.

### වඩාත් උග්‍ර වූ ශාරීරික පීඩාවන්

කොවිඩ් රෝගය විශේෂයෙන් ම වැඩිහිටියන් සහ පෙර සිට පැවත එන රෝගී තත්වයන් සහිත අය අතර සෘජු ශාරීරික පීඩාවන් ඇති කළේ ය. කෙසේ වෙතත්, වසංගතයට ශ්‍රී ලංකා රජය විසින් දක්වන ලද ප්‍රතිචාරය පෙර සිට පැවත එන රෝගී තත්වයන් සහිත පුද්ගලයන් අතර ශාරීරික පීඩා උග්‍ර කළේ ය. පිළිකා, හෘද රෝග, දියවැඩියාව හෝ නිදන්ගත වකුගඩු රෝග වැනි නිදන්ගත රෝග වලින් පෙළෙන රෝගීන්ට ඔවුන්ගේ සායන වලට සහභාගී වීමට නොහැකි වියග නැත

හොත් වෛරසය ආසාදනය වෙතැයි තිබූ බිය නිසා ඔවුන් සායන වලට සහභාගී නොවූහ.එපමණක් නොව, වසංගත කාලය තුළදී වෛද්‍යවරුන් ආරක්ෂිත දුරකින් සිට රෝගීන් පරීක්ෂා කළ බැවින් තමන්ව නිසි ලෙස පරීක්ෂා නොකළේ යැයි ප්‍රතිකාර ලබා ගැනීමට ගිය ඇතැම් රෝගීහු පැමිණිලි කළහී ඇතැම් රජයේ රෝහල්වල ඖෂධ නොතිබූ නිසා ඇතැමුන්ට පෞද්ගලික ඔසුසල්වලින් තම ඖෂධ මිලදී ගැනීමට සිදු වූ අතර, එය බොහෝ විට මිල අධික වියී එයට අමතරව වසංගතය අතරතුර දී, රජය අනෙකුත් රෝගවලට වඩා කොවිඩ් රෝගය පාලනය කිරීමට සහ එයට ප්‍රතිකාර කිරීමට ප්‍රමුඛත්වය දීමට උත්සාහ දැරූ නිසා කොවිඩ් නොවන අනෙකුත් රෝගීන්ගේ ශාරීරික යහපැවැත්ම විශේෂයෙන් ම පෙර සිට පැවතෙන රෝගී තත්ත්වයන් සහිත අයගේ ශාරීරික යහපැවැත්මට එය අහිතකර විය. වඩාත් කනස්සලු සහගත කරුණ නම් එවැනි උත්සාහයන් ඒ වන විටත් අවදානම් සහගත තත්ත්වයන්හි සිටි ජනගහනය තුළ තවදුරටත් මානසික සහ මනෝ සමාජීය සංකූලතා ඇති කළ බැවින් ඔවුන්ගේ ශාරීරික පීඩාවන් තවත් සංකීර්ණ විය. අනාගත මහජන සෞඛ්‍ය ප්‍රතිචාර මගින් හදිසි අවස්ථා සීමා කිරීම් සහ අත්‍යාවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර අඛණ්ඩව පවත්වා ගෙන යාම අතර සමබරතාවයක් ඇති කළ යුතු ය. සාමාන්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය සහතික කිරීම, විශේෂයෙන් ම ඉහළ අවදානම් සහිත තත්ත්වයන්හි සිටින රෝගීන් සඳහා නිතිපතා ලබා දෙන ප්‍රතිකාර අඛණ්ඩඩ ලබා දීම සහතික කිරීම, ක්ෂණික හා දිගු කාලීන ශාරීරික සහ මානසික සෞඛ්‍ය ප්‍රතිවිපාක අවම කිරීම සඳහා අතිශය වැදගත් වේ.

## නිර්දේශ

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා අතරතුර දී ආරක්ෂිත, ගරුත්වයෙන් යුතු සහ රෝගයා කේන්ද්‍රකර ගත් සේවා සපයා දීම සඳහා සෞඛ්‍ය සේවකයන් පුහුණු කිරීම.

- රෝගීන්ට දුරස්ථ ක්‍රමයට තම වෛද්‍යවරුන් වෙත ප්‍රවේශ වීමට සහ ඖෂධ ලබා ගැනීමට පහසුකම් සැලසීම පිණිස භාෂා තුනෙන් ම ටෙලිමෙඩිසින් සහ ටෙලිහෙල්ත් වේදිකා සකස් කිරීම.

- ප්‍රමුඛතාවය ලබා දෙන කරුණක් ලෙස, පෙර සිට පැවතෙන රෝග තත්ත්වයන් ඇති අයට සෞඛ්‍ය සේවා අඛණ්ඩව සපයා දීම සහතික කිරීම.

- පෙර සිට පැවතෙන රෝග තත්ත්වයන් සහිත අය සඳහා ජංගම සහ ගෘහස්ථ වෛද්‍ය ප්‍රතිකාර සහ සෞඛ්‍ය සත්කාර සේවා සැපයීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

## ආර්ථික ආතතීන් ඇතිකරවන සාධක

සමස්ත දිවයින ම වසා දැමීම මගින් වෛරසය පැතිරීම පාලනය කිරීමට රජය ගත් තීරණය මගින් දුරස්ථ ක්‍රමයට රාජකාරි ඉටුකරමින් තමන්ගේ වැටුප් අඛණ්ඩව ලබා ගැනීමට හැකි වූ නාගරික සුදු කරපටි රැකියාවල නියුතුව සිටි සේවකයින්ගේ ආර්ථික යහපැවැත්මට ඇති කළ බලපෑම ඉතා සීමිත විය. කෙසේ වෙතත් මෙම පියවර ගැනීම අවිධිමත් අංශයේ සේවය කළ සහ සංචලනය මත යැපෙන රැකියාවල නියුතු සේවකයන්ගේ ආර්ථික ආරක්ෂාව සහ ස්ථාවරත්වය බොහෝ සෙයින් අඩපණ කළේ ය.

උදාහරණයක් ලෙස, ධීවර රැකියාවල නියුතු වූවන්ට මුහුදු යාමට නොහැකි වූ අතර ධීවර කර්මාන්තයේ යෙදීමට අවසර දුන් විට පවා ප්‍රවාහන සීමාවන් පනවා තිබීම සහ වෙළඳපොළ වසා තිබීම හේතුවෙන් ඔවුන්ට ඔවුන්ගේ අස්වැන්න විකිණීමේ දී සැලකිය යුතු අභියෝගවලට මුහුණ දීමට සිදු විය. ආදායම් අහිමිවීම පවුල් ණයගැතිභාවයට තල්ලු කර ඇති බවත්, පවුල්වලට තම දරුවන්ව පෝෂණය කිරීම හෝ වැඩිවන ණය ආපසු ගෙවීම යන දෙකෙන් එකක් තෝරා ගැනීමට සිදුවී ඇති බවත් වවුනියාවේ ගොවීහු සඳහන් කළහ.

වසංගතයක් මධ්‍යයෙහි එවැනි දුෂ්කර තීරණ ගැනීමේ අභියෝගයට සහ ගැඹුරු ආර්ථික අවිනිශ්චිතතාවයකට මුහුණ දීමට සිදුවීම සැලකිය යුතු මානසික ආතතියක් ඇති කරන සාධකයක් ලෙස හඳුනාගෙන ඇති අතර  එය හඳුනා නොගත හොත් සහ එයට අවධානය යොමු නොකළ හොත් දැනටමත් ආන්තිකකරණයට මුහුණදී සිටින කණ්ඩායම් අතර දිගු කාලීන මානසික සෞඛ්‍ය ගැටළු ඇති විය හැකිය. මෙම අත්දැකීම්

# රෝගීන්ගේ අයිතිවාසිකම්

## මානසික සෞඛ්‍යයට ප්‍රමුඛත්වය ලබා දීම

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ පවතින ව්‍යුහාත්මක අවදානම් ඉස්මතු කරන අතර, දැනටමත් අස්ථාවර තත්ත්වයන්හි සිටින කණ්ඩායම් අතර දිගු කාලීන මානසික සෞඛ්‍ය සංකූලතා ඇති වීම වළක්වා ගැනීම සඳහා අනාගත මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා සැලසුම්කරණයට ආර්ථික ආරක්ෂණයන් ඒකාබද්ධ කිරීමේ හදිසි අවශ්‍යතාවය අවධාරණය කරයි.

### නිර්දේශ

- සියලුම ජාතික මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් වලට පුළුල් ආර්ථික හා ජීවනෝපාය බලපෑම් ඇගයීම් ඇතුළත් කරන ලෙස, විශේෂයෙන් ම අවිධිමත් අංශයේ රැකියාවල සහ සංචලතාව මත යැපෙන රැකියාවල නියුතු සේවකයින් පිළිබඳ එම ඇගයීම් ඇතුළත් කරන ලෙස නියම කළ යුතු වේ.

- ආර්ථික අර්බුද විවිධ ජනවිකාස කණ්ඩායම්වලට විවිධ ආකර වලින් බලපෑ හැකි බවත්, ඒ අනුව, අර්බුද මගින් ඔවුන්ගේ මානසික සෞඛ්‍යයට ඇතිකරන බලපෑමට ද මෙය අදාළ වන බවත් හඳුනා ගැනීම.

- මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා මගින් තම ජීවනෝපායන්ට අහිතකර බලපෑම් ඇතිවන සේවකයන්ට මානසික සෞඛ්‍ය ආතතීන් ඇතිකරන සාධක ඉවත් කිරීම සඳහා උපකාරී වනු පිණිස සෘජු මූල්‍ය ආධාර හෝ ආදායම් ආදේශක සැපයීම සඳහා ම වෙන්වූ ජාතික අරමුදලක් නිර්මාණය කිරීම.

### සංවර්ධනය සහ අධ්‍යාපනය මත ඇතිකරන අභියෝග

කොවිඩ් වසංගතයට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා රජය අධ්‍යාපනික උපදෙස් සපයා දීම මාර්ගගත ක්‍රමය වෙත මාරු කළේ ය. මෙම මාරුවීම රට පුරා සිසුන්ට බලපෑම් ඇතිකළ අතර එහි ප්‍රතිවිපාක ග්‍රාමීය සහ වතු ප්‍රජාවන් අතර බෙහෙවින් දරුණු විය. නාගරික, මධ්‍යම පාන්තික පවුල්වලට බොහෝ විට අන්තර්ජාලය වෙත ස්ථාවර ප්‍රවේශය සමග ඩිජිටල් උපාංග තිබුණු නමුත් වඩාත් දුරබැහැර  ප්‍රදේශවල සිසුන් මාර්ගගත අධ්‍යාපනයට සහභාගීත්වීමේ දී බොහෝ බාධකවලට මුහුණ දුන්හ.

රැකියා අහිමිවීම නිසා දුරකථන හෝ ලැප්ටොප් පරිගණක මිලදී ගැනීමට තමන්ට නොහැකි වූ බව ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා වලදී දෙමව්පියෝ විස්තර කළහ. මාර්ගගත පන්තිවලට සම්බන්ධ වීමට ප්‍රමාණවත් තරම් ප්‍රබල සංඥා පහසුකම් සොයා ගැනීම සඳහා තම ගමේ ළමයින්ට අසල පිහිටි කන්දකට නැගීමට සිදු වූ බව එක් දෙමාපියෙක් සඳහන් කළේ ය. දීර්ඝ කාලයක් තිස්සේ දර්ශන තිරය දෙස බලා සිටීම ළමයින්ගේ මානසික හා සමාජීය සංවර්ධනයට හානිදායක බවත් ජංගම උපාංග මත යැපීම චර්යාමය ගැටළු වලට තුඩු දෙන බවත් පවසමින් දෙමව්පියන් ඒ පිළිබඳ කනස්සල්ල පළ කළහ. එපමණක් නොව, දෙමව්පියන් මාර්ගගත අධ්‍යාපනය පන්ති කාමරය තුළ සිදුකරන අධ්‍යාපනය සඳහා සහ අනෙකුත් ළමයින් මෙන්ම ගුරුවරුන් සමග සිදුකරන අන්තර්ක්‍රියා සඳහා ආදේශකයක් ලෙස සැලකුවේ නැත. මේ අනුව, වසංගතය පැවති කාලය තුළ දී සිසුන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වූවා පමණක් නොව එවැනි අත්දැකීම් ළමයින්ට සහ ඔවුන්ව රැකබලා ගත් අයට සාංකාව සහ වෙනත් මානසික සෞඛ්‍ය ගැටළුවල මූලාශ්‍රයක් විය.

මාර්ගගත අධ්‍යාපනය වෙත මාරුවීම ඇතමුන්ට අධ්‍යාපනයේ අඛණ්ඩතාවය පවත්වා ගැනීමට උපකාරී වූ නමුත් එමගින් තවත් පිරිසක් විශේෂයෙන් ම ඒ වන විටත් ආර්ථික වශයෙන් සහ සමාජීය වශයෙන් ආන්තිකකරණය වී සිටි අය පෙරටත් වඩා පසුගාමී තත්ත්වයට පත් කළේ ය. අධ්‍යාපනය බොහෝ ශ්‍රී ලාංකික පවුල්වල අභිලාෂයන් තුළ ප්‍රධාන ම කාර්යභාරය ඉටුකරන බව සැලකිල්ලට ගනිමින්  අනාගත මහජන සෞඛ්‍ය ප්‍රතිචාරවලට අවදානමට ලක්විය හැකි සිසුන්ගේ අධ්‍යාපන අවස්ථා ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම අත්‍යාවශ්‍ය වේ. එවැනි විධිවිධාන නොමැති වුව හොත් අවදානමට ලක්විය හැකි සිසුන්ගේ සහ පවුල්වල මානසික සෞඛ්‍ය මත ඇතිකරන බලපෑම ඉතා ගැඹුරු විය හැකි අතර අධ්‍යාපනයේ පවතින විෂමතා තවදුරටත් පුළුල් විය හැකිය.

# රෝගීන්ගේ අයිතිවාසිකම්

## මානසික සෞඛ්‍යයට ප්‍රමුඛත්වය ලබා දීම

### නිර්දේශ

අර්බුදකාරී කාලවලදී පවා අධ්‍යාපනයෙහි ඇති අතිශය ඉහළ වැදත්කම අවබෝධ කර ගනිමින්:

- දුර බැහැර ප්‍රදේශවල ජංගම දත්ත ආවරණය සහ අධිවේගී අන්තර්ජාල ප්‍රවේශය පුළුල් කිරීම.
- අන්තර්ජාල ප්‍රවේශය සපයා දීම ප්‍රායෝගික නොවන ස්ථානවල ළමයින්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු කිරීම සහතික කිරීම පිණිස ගුවන්විදුලිය, රූපවාහිනිය සහ මුද්‍රිත ද්‍රව්‍ය හරහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම සහ ඒවා ශක්තිමත් කිරීම.
- ආන්තිකකරණයට ලක්වී ඇති සිසුන්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඵලදායී ලෙස මිශ්‍ර අධ්‍යාපනය සහ දුරස්ථ අධ්‍යාපනය සපයා දීමට ගුරුවරුන් සන්නද්ධ කිරීම.
- අර්බුදකාරී කාලවලදී සිසුන් අතර ඇතිවිය හැකි මානසික සෞඛ්‍ය ගැටළු පිළිබඳව දැනුවත් කිරීම සඳහා සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම.

### සමාජ සහ සංස්කෘතික දුරස්ථභාවය

කොවිඩ් වසංගතය හේතුවෙන් අනපේක්ෂිත ආකාරයේ සමාජීය හා සංස්කෘතික දුරස්ථභාවයක් නිර්මාණය විය. පළමුවෙන් ම රජය විසින් රට වසා දැමීම සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ ජීවිතය හදිසියේ ම කඩාකප්පල් කළේ ය. පුද්ගලයන්ට සහ පවුල්වලට ඔවුන් සතු සංනිවේදන උපාංග හරහා බාහිර ලෝකය සමග අන්තර්ක්‍රියා සිදු කරමින් නිවසේ රැඳී සිටීමට සිදුවිය. ඇතැම් පුද්ගලයන්ට මෙම සමාජ හුදකලාව සංකාව ඇතිවීමට සහ මානසික සෞඛ්‍ය රෝග ඇතිවීමට පවා හේතුවක් වූ අතර, ඇතැම් කාන්තාවන්ට මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් වැඩි වැඩියෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට සිදු විය. දෙවනුව රට වසා දැමීම ජනතාවගේ සංස්කෘතික ජීවිතයට ද බලපෑම් ඇති කළේ ය. මහජන රැස්වීම් පැවැත්වීම තහනම් කිරීමත් සමග රට පුරා ආගමික ප්‍රජාවන්ට ඔවුන්ගේ වාර්ගික ආගමික වත්පිළිවෙත්වල නිරත විය නොහැකි විය. හින්දු බැතිමතෙක් සඳහන් කළ ආකාරයට එලෙස දෙවිවරුන්ගෙන් සහ ආගමික වත්පිළිවෙත් වලින් දුරස්වීම ඇතමුන්ට සාංකාව ඇතිවීමේ මූලාශ්‍රයක් වූ අතර තමන් දෙවිවරුන් නොසලකා හැර ඇතැයි තමන්ට හැඟෙන නිසා ඔවුන් බියෙන් සිටි බව ද අවධාරණය කළේ ය. තෙවනුව ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල වෛරසය වැළඳුණු පුද්ගලයන්ට සමාජීය වශයෙන් අපකීර්තියට ලක්වීමේ අමතර බර දරා ගැනීමට ද සිදු වියි. හවුලේ බෙදාගන්නා නවාතැන්පළ වල ජීවත් වූ ඇඟළුම් කම්හල් සේවකයන්, නාගරික දුප්පතුන් සහ වතු සේවකයන් වැනි එකිනෙකාට සමීපව සිටින ස්ථානවල ජීවත් වන ප්‍රජාවන් අතර රෝගය සම්ප්‍රේෂණයවීම සීඝ්‍රයෙන් සිදුවීම සහ නිර්නාමිකභාවය නිසා එම සමාජ අපකීර්තිය විශේෂයෙන් දැඩි විය. කොවිඩ් වෛරසය පැතිරීම සීමා කිරීම සඳහා ගනු ලැබූ පියවර සහ වෛරසය සඳහා දැක්වූ සමාජීය ප්‍රතිචාර පවා බොහෝ ප්‍රජාවන්ට සාංකාව ඇති කිරීමට හේතු වූ බව මෙම කතා වලින් පැහැදිලි වෙයි. එබැවින් වසංගතය පැවති කාලය තුළ ප්‍රායෝගිකව ම ලැබූ සමාජීය හා සංස්කෘතික අත්දැකීම් කල් පවත්නා බලපෑම් ඇති කළ හැකි මානසික හා මානසික සෞඛ්‍ය ප්‍රතිවිපාක ඇතිවීමට දායක විය. එබැවින් අනාගත මහජන සෞඛ්‍ය අර්බුද ප්‍රතිචාර මගින් එවැනි අර්බුද සහ ඒවා සඳහා දක්වන ප්‍රතිචාර සමාජීය හා සංස්කෘතික වශයෙන් අත්විඳිනු ලබන ආකාරය සහ එවැනි ක්‍රියාවලීන් මගින් මනෝවිද්‍යාත්මක හා මානසික වශයෙන් හානියක් සිදු හැකි ආකාරය සැලකිල්ලට ගත යුතුය.

### නිර්දේශ

- ජාතික මහජන සෞඛ්‍ය හදිසි ප්‍රතිචාර සැලසුම් සහ සන්නිවේදන උපාය මාර්ග සැලසුම් සකස් කිරීමේ වගකීම පැවරී ඇති ආයතනවලට ආගමික නායකයන්, සමාජ විද්‍යාඥයන්, අධ්‍යාපනඥයන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් ඇතුළත් කිරීම සහ එමගින් සෞඛ්‍ය හදිසි අවස්ථා වල බලපෑම සෞඛ්‍ය අංශයෙන් ඔබ්බට යන බව පිළිගැනීම.

# රෝගීන්ගේ අයිතිවාසිකම්
## මානසික සෞඛ්‍යයට ප්‍රමුඛත්වය ලබා දීම

- මහජන සෞඛ්‍ය අභියෝගය අවම කළ හැකි මැදිහත්වීම් සැලසුම් කරන අතරම, ප්‍රධාන ආගමික හා සංස්කෘතික කාර්යයන් නිසි සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ අඛණ්ඩව සිදු කිරීමට ඉඩ සැලසීම.
- මහජන සෞඛ්‍ය අර්බුදවලදී රෝගවලට ගොදුරු වූවන් ඔවුන්ට සිදුවන සමාජ හානියෙන් ආරක්ෂා කිරීම සඳහා අපකීර්තියට පත්කිරීමට එරෙහි මාධ්‍ය ව්‍යාපාර පැවැත්වීම.
- ජාතික මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා වලදී එකිනෙකාට සහයෝගය දැක්වීම සඳහා ප්‍රජාවන් එකට එක්වීම දිරිගන්වන නිර්මාණශීලී මාධ්‍ය ව්‍යාපාර පැවැත්වීම.

### සමාප්තිය

ශ්‍රී ලංකාවේ පෙර නොවූ විරූ මහජන සෞඛ්‍ය අර්බුදයට එහි රජය සාධාරණ ලෙස ප්‍රතිචාර දැක්වූ බව කොවිඩ් වසංගතය පිළිබඳ ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන වලින් පෙන්නුම් කරයි. දියුණු ආර්ථිකයන් සහිත රටවල් හා සසඳීමේ දී ශ්‍රී ලංකාවේ කොවිඩ් ආසාදන හා මරණ අනුපාතය සැලකිය යුතු ලෙස අඩු ය. මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක දී ඇතිවන අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමට මුලදී සූදානම්ව නොසිටියත්, දැඩි අගුලු දැමීම් පැනවීම, නිරෝධායන පහසුකම් සකස් කිරීම, නිවසේ දී නිරෝධායනය වන කොවිඩ් රෝගීන් සඳහා සීමිත සුහසාධන පැකේජ සපයාදීම, ජාතික රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකා මගින් පාසල් පන්ති වැඩසටහන් විකාශනය කිරීම සහ සායන වලට සහභාගී වන රෝගීන්ට තැපැල් මගින් ඖෂධ සපයා දීම වැනි තීරණ ක්‍රියාත්මක කිරීම මගින් වසංගතයේ සෞඛ්‍ය බලපෑම අවම කළ බව මෙයින් පෙන්නුම් කරයි.

කෙසේ වෙතත් මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය මගින් අවධාරණය කරන පරිදි අවදානම් සහගත තත්ත්වයන්හි සිටින ප්‍රජාවන්ගේ ප්‍රායෝගික අත්දැකීම් වඩාත් සංකීර්ණ රූපයක් චිත්‍රණය කරයි. වසංගතය සඳහා රජය දැක්වූ ප්‍රතිචාරය අවදානම් සහගත තත්ත්වයන්හි සිටින ප්‍රජාවන්ට අසමාන ලෙස සහ අසමානුපාතික ලෙස බලපෑ බව ඔවුන්ගේ කතාවලින් හෙළි වෙයි. එවැනි අත්දැකීම් මේ වන විටත් අවදානමට ලක්විය හැකි තත්ත්වයන්හි සිටින කණ්ඩායම් අතර මානසික සෞඛ්‍ය අරගල සහ ගැටළු ඇති කළ හැකිය. මෙම තත්ත්වයන් තුළ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා වල මානසික සෞඛ්‍ය ප්‍රතිවිපාකවල වැඩි බරක් දැරීමට සිදුවන්නේ සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට ය. කාලය ගතවන විට මෙම කණ්ඩායම් සමාජ, දේශපාලනික සහ ආර්ථික ක්‍රියාවලීන් සමග පමණක් නොව, අවදානමට ලක් වූ තමන්ගේ ම මානසික සෞඛ්‍යය සමග ද අරගල කරන බැවින් එමගින් මෙම කණ්ඩායම් ගැඹුරු අවිනිශ්චිතතාවයකට ඇද දැමිය හැකිය. එබැවින් අනාගත ශ්‍රී ලංකා රජයන් සමාජයේ අවදානමට ලක්විය හැකි කොටස්වල යහපැවැත්මට හානි නොකර මහජන සෞඛ්‍යය සුරක්ෂිත කරන බව සහතික කිරීම සඳහා මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය මගින් නිර්දේශ ඉදිපරිත් කරයි. අනාගත මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා සඳහා වඩාත් අන්තර්කරණය වූ, සාකල්‍ය සහ සියුම් ප්‍රතිචාරයක් සැලසුම් කිරීම සඳහා මෙම ලියවිල්ල උපකාරී වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.